කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
DEPARTMENT OF METEOROLOGY

383, බෞද්ධාලෝක මාවත කොළඹ 07, ශ්‍රී ලංකාව | 383, பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07, இலங்கை | 383, Bauddhaloka Mawatha, Colombo 07, Sri Lanka

තද සුළං සහ රළු මුහුදු පිළිබඳ අනතුරු ඇඟවීමේ නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
ස්වාභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය

රතු • ක්‍රියාත්මක වන්න

නිකුත් කළේ	වලංගු වන්නේ (සිට)	වලංගු වන්නේ (දක්වා)	නිවේදන අංකය
16 නොවැම්බර් 2026 10:49 PM	**16 නොවැම්බර් 2026** 11:00 PM	**17 නොවැම්බර් 2026** 11:00 PM	**MSW/26/11/16/02-SI**

⚠ **බටහිර මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ යාත්‍රා කරන බහුදින ධීවර යාත්‍රා සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන්වන මුහුදු ප්‍රදේශ සඳහා.**

ගිනිකොනදිග බෙංගාල බොක්ක සහ ඊට යාබද නිරිතදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පැවති ගැඹුරු පීඩන අවපාතය 'සුළි කුණාටුවක්' දක්වා වර්ධනය වී ඇති අතර එය "Akvan" (අක්වාන්) ලෙස නම්කර ඇත.

මෙම පද්ධතිය 2026 නොවැම්බර් මස 16 වන අද පස්වරු 05.30 පමණ වන විට උතුරු අක්ෂාංශ 12.2° සහ නැගෙනහිර දේශාංශ 85.7° ආසන්නයේ කේන්ද්‍රගතව පැවතිණි.මෙම පද්ධතිය තවදුරටත් උතුරු-වයඹ දෙසට ගමන් කරමින්, 2026 නොවැම්බර් මස 17 වන දින ප .ව .05.30 පමණ වන විට බටහිර මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේදී **"ප්‍රබල සුළි කුණාටුවක්"** දක්වා තවදුරටත් වර්ධනය වීමට ඉතා වැඩි ඉඩකඩක් පවතී.


ඉන් අනතුරුව, මෙම පද්ධතිය වයඹ දෙසට ගමන් කරමින්, නොවැම්බර් මස 19 වන දින පෙ .ව .05.30 පමණ වන විට **"ඉතා ප්‍රබල සුළි කුණාටුවක්"** දක්වා තවදුරටත් වර්ධනය වීමට ඉඩ ඇත. තවදුරටත් වයඹ දෙසට ගමන් කරමින්, මෙම පද්ධතිය 2026 නොවැම්බර් මස 20 වන දින පෙ . ව .11.30 පමණ වන විට, ඉතා දරුණු සුළි කුණාටුවක් ලෙස ඉන්දියාවේ ආන්ද්‍රා ප්‍රදේශ් සහ යනාම් වෙරළ තීරයේ නෙල්ලෝර් සහ ටුනි අතරින් වෙරළ තරණය කිරීමට ඉඩ ඇත.

එමනිසා, උතුරු අක්ෂාංශ 05ත් 17ත් සහ නැගෙනහිර දේශාංශ 80ත් 90ත් අතර මුහුදු ප්‍රදේශවල සහ කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවලත් නැවත දැනුම් දෙනතුරු ධීවර සහ නාවුක කටයුතුවලින් වැලකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ. එම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතු වල යෙදෙන ප්‍රජාවන් ආරක්ෂිත ප්‍රදේශ කරා යාත්‍රා කරන ලෙසත් උපදෙස් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඉදිරි අනාවැකි සහ නිවේදන පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස ධීවර සහ නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: Udeni Weerasinghe
0112686686


Warning for Fishing and Naval Communities.
Issued at 11.00 p.m. on 16 November 2026.
Valid from 11.00 p.m. on 17 November



පුරෝකථනය කරන ලද ස්ථාන සහ තීව්‍රතා:

දිනය	වේලාව	ස්ථානය /උතුරු අක්ෂාංශ) (නැගෙනහිර දේශාංශ	කැළඹිලි ස්වභාවය
2026-11-16	ප .ව .05.30	12.2/85.7	සුළි කුණාටුව
2026-11-16	ප .ව .11.30	12.7/85.3	සුළි කුණාටුව
2026-11-17	පෙ .ව .05.30	13.1/84.8	සුළි කුණාටුව
2026-11-17	පෙ . ව .11.30	13.4/84.3	සුළි කුණාටුව
2026-11-17	ප.ව 05.30	13.7/83.9	ප්‍රබල සුළි කුණාටුව
2026-11-18	පෙ .ව .05.30	14.0/83.4	ප්‍රබල සුළි කුණාටුව
2026-11-18	ප.ව 05.30	14.4/82.9	ප්‍රබල සුළි කුණාටුව
2026-11-19	පෙ .ව .05.30	14.8/82.4	ඉතා ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-19	ප.ව 05.30	15.2/81.8	ඉතා ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-20	පෙ .ව .05.30	15.5/81.3	ඉතා ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-20	ප.ව 05.30	15.9/80.8	ප්‍රබල සුළි කුණාටුවක්
2026-11-21	පෙ .ව .05.30	16.3/80.3	සුළි කුණාටුවක්

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: Udeni Weerasinghe
0112686686



Source: https://rsmcnewdelhi.imd.gov.in

www.meteo.gov.lk
https://was.meteo.gov.lk
කාලගුණවිද්‍යාඥ: Udeni Weerasinghe
0112686686